SLGURU.LK

ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය
Sri Jayawardanapuara Education Zone

දෙවන වාර පරීක්ෂණය -2026
Second Term Test - 2026

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය: 10 ශ්‍රේණිය<br>Grade | විෂයය: නාට්‍ය හා රංග කලාව<br>Subject | පත්‍රය : I,II<br>Paper | කාලය; පැය: 3 යි.<br>Time |

නම: / Name ..........................................................

විභාග අංකය : / Index Number ........................................

| | |
|---|---|
| අමතර කියවීම් කාලය - මිනි. 10<br>Additional Reading Time - 10 minutes | අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න |

උපදෙස් :

- සියලු ම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරා ගන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
- එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා ඒවා ද පිළිපදින්න.

## 1 කොටස

- පහත දැක්වෙන කවි, ගීත හා දෙබස් ඇසුරෙන් අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A. (ඇය ළඟට ගොස්) මෙයා හරි ලාබාල පාටයි. වයස අවුරුදු දහයක්වත් පැනල නෑ. (ගොස් ඇය අතින් අල්ලයි) නංගි හාමි!

B. රතදර සිරියා පරදන - රූපෙට වටිනා නිමල කොමළ තරුණී

C. ලප නොමවන් සඳ සේ සොම් ගුණෙනා
ආදර දිනනා සිසු සැවොමා

D. වඩිග පුර දේසෙන
සත්දෙන බමුණු ඇවිදින

E. යුද්දෙට මං ගියා
ගෑනි ගෙදර තියා

1. දේශීය නාඩගම් සම්ප්‍රදාය ඇසුරු කර ගනිමින් කරන ලද නාට්‍ය නිර්මාණ වන්නේ,

(1) A හා B (2) B හා C (3) C හා D (4) D හා E

2. පහතරට ප්‍රදේශයේ රඟ දක්වන ලද ශාන්තිකර්මයන් වන්නේ,

(1) A හා C (2) A හා D (3) B හා C (4) D හා E


For Educational Purpose Only

SLGURU.LK

3. ස්ත්‍රී චරිත විසින් ඉදිරිපත් කරනු ලබන්නේ,
(1) A හා B (2) C හා D (3) B හා C (4) D හා E

4. හෙන්රි ජයසේනයන්ගේ විශිෂ්ඨතම පරිවර්තන නාට්‍ය කෘතියක් වන්නේ,
(1) B (2) C (3) D (4) E

5. සුනියම් යාගය ශාන්ති කර්මායෙහි අන්තර්ගත අන්තර් රංගමය අවස්තාවක් වන්නේ,
(1) A (2) B (3) C (4) D

6. " නෘත්ත " යනුවෙන් හඳුන්වනු ලබන්නේ,

(1) භාව ප්‍රකාශනයෙන් තොර හුදු නතනයකි. (2) මණිපුරි නර්තන අංගයකි.
(3) මුද්‍රා නාට්‍ය අංගයකි. (4) කාව්‍ය ශාස්ත්‍රයෙහි අන්තර්ගත සංකල්පයකි.

7. වේදිකා නාට්‍යයක් පිළිබඳව සත්‍ය නොවන්නේ,

(1) සජීවී බව සුවිශේෂී වේ
(2) නාට්‍යාචිත අවස්ථා මගින් ඉදිරිපත් කරයි.
(3) පෙළ සාහිත්‍යය සුවිශේෂී ලක්ෂණයක් නොවේ.
(4) සාමූහික ප්‍රයත්නයක ප්‍රතිඵලයකි.

8. අනුෂාංගික කලා ගණයේ ලා නොසැලකෙන්නේ,
(1) පෙළ රචනය (2) ද්වේෂ භූෂණ (3) අංග රචනය (4) අලෝකකරණය

9. චරිතයකට ආරෝපණය වී කිසියම් කාල සීමාවක් එහි ජීවත්වීමේ නළු කාර්යය,
(1) අභිරූපණය (2) භාව ප්‍රකාශනය (3) රූපණය (4) සමාරෝපය

10. පහත සඳහන් මාධ්‍යය අතරින් දෘශ්‍ය මාධ්‍ය ගණයේ ලා සැළකෙන්නේ,

(1) මූර්ති හා කැටයම් (2) බැලේ හා ඔපෙරා
(3) චිත්‍රපට හා ටෙලි නාට්‍ය (4) මුද්‍රා නාට්‍ය හා කාටූන්

11. එදිනෙදා ජීවිතයේ දී ආයාසයකින් තොරව අප විසින් කරනු ලබන ඇවිදීම වැනි චලන හඳුන්වනු ලබන්නේ,

(1) ස්වාභාවික චලන (2) නිර්මිත චලන
(3) තාලානුකූල චලන (4) කෘත්‍රිම චලන

12. පහත සඳහන් නිර්මාණ අතරින් වාචික අභිනය දක්නට ලැබෙන්නේ,

(1) අභිරූපණ (2) නෘත්‍ය නිර්මාණ
(3) මුද්‍රා නාට්‍ය (4) ඔපෙරා

13. කතන්දරයක සහ වේදිකා නාට්‍යයක දක්නට ලැබෙන පොදු කරුණක් වන්නේ,

(1) චරිත නිරූපණ (2) සංවාද මතින් ගොඩ නැගීම
(3) අනුෂංගික කලා (4) ප්‍රබල ගැටුම් අවස්ථාවක්

14. දේවදූතයෙකු සේ වෙස් ගන්වන ලද කුඩා පිරිමි දරුවෙකු පිළිබඳ සඳහන් වන බෞද්ධ පූජා කර්මය වන්නේ,

(1) මිලින්ද ප්‍රශ්නය (2) දොරකඩ අස්න
(3) ආලවක දමනය (4) යුගාසන බණ


For Educational Purpose Only

SLGURU.LK

15. ම'හාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් පුරාවෘත්තයක් ඇසුරින් නිර්මාණය කළ විශිෂ්ඨ නාට්‍යයක් වන්නේ,

(1) මනමේ (2) සිංහබාහු
(3) පබාවතී (4) කදා වළලු

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට දී ඇති වරණ 04 අතරින් නොගැළපෙන වරණය තෝරන්න.

16. (1) නානුමුරය (2) වඩිග පටුන (3) දරු නැළවිල්ල (4) කපු යක් කංකාරිය

17. (1) සූනියම් යක්ෂණිය (2) කළු යකා (3) මංගර දෙවි (4) රීරි යකා

18. (1) අසූපාලි (2) වඩිග බමුණෝ (3) මැණික්පාල (4) වසර්වර්ති

19. (1) සති පිරිත (2) මිලින්ද ප්‍රශ්නය (3) සන්නියකුම (4) ආලවක දමනය

20. (1) සළු පැළඳීම (2) හවරිය පැළඳී (3) තෝඩු පැළඳීම (4) ගමන් යෑම

- ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා පහත වගුව ඇසුරින් පිළිතුරු සපයන්න.

| මුල් නාට්‍යය | මුල් නාට්‍යකරුවා | අනුවර්තන/ පරිවර්තන නාට්‍ය | අනුවර්තන/ පරිවර්තන නාට්‍ය කරුවා |
|---|---|---|---|
| ටී හවුස් ඔෆ් ද ඔගස්ට මූන් | වන්ස් හයිඩර් | A ................................... | සුගතපාල ද සිල්වා |
| B ................................... | ඇල්බෙයා කැමූ | විනිශ්චය | පරාක්‍රම කිරි ඇල්ල |
| ඉක්නොවිටාඉ | C ................................... | බෙර හඬ | බන්දුල ජයවර්ධන |
| ද කොකේසියන් සර්කල් චෝක් | බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් | හුණුවටයේ කතාව | D ................................... |
| E ................................... | ඇන්ටන් චෙකෝෆ් | මහගෙදර | රන්ජිත් ධර්මකීර්ති |

2.1. A කොටුවට අදාළ පිළිතුර වන්නේ,

(1) බෝඩිංකාරයෝ (2) සත සහ සත

3) ඇසළ සඳ අවන්හල (4) මරාසාද්


SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

22. B කොටුවට අදාළ පිළිතුර වන්නේ,

(1) ද ජස්ට් (2) ගැලීලියෝ (3) උත්තමාවී (4) වරෙන්තු

23. C කොටුවට අදාළ පිළිතුර වන්නේ,

(1) මැක්සිම් ගෝර්කි (2) ටෙනසි විලියම්ස් (3) සොෆොක්ලීස් (4) රේ කුනී

24. D කොටුවට අදාළ පිළිතුර වන්නේ,

(1) එදිරිවිර සරච්චන්ද්‍ර (2) සුගතපාල ද සිල්වා

(3) ධම්ම ජාගොඩ (4) හෙන්රි ජයසේන

25. E කොටුවට අදාළ පිළිතුර වන්නේ,

(1) ද වෙරි ඔර්වාර්ඩ (2) ඇපල් කාර්ට් (3) ද ෆාදර් (4) ද ප්‍රපෝසල්

26. වේදිකාව මත රංගනය ඉදිරිපත් කිරීමේ දී සංවාද කොටස් හඬ නගා පැහැදිලිව උච්චාරණය කිරීමට උපකාරී වන රංග අභ්‍යාස වන්නේ,

(1) ශ්වසන අභ්‍යාය හා ශිථිල කරණ අභ්‍යාස

(2) කටහඬ අභ්‍යාස හා ශ්වසන අභ්‍යාස

(3) කටහඬ අභ්‍යාස හා සංවේදන අභ්‍යාස

(4) ශ්වසන අභ්‍යාස ඇඟ උණුසුම් කිරීමේ අභ්‍යාස

27. ක්ෂණික නිරූපණ පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) ඒ කලව සහ සාමූහිකව සිදු කළ හැකිවේ.

(2) පෙර සූදානමකින් තොරව ඉදිරිපත් කරයි.

(3) පිටපතකට අනුව ඉදිරිපත් කරයි.

(4) නිරූපණයෙහිලා නිර්මාණශීලී චින්තනය හා පරිකල්පනය වැදගත් වේ.

28. " මෝරා සහ දූපත " රංග ක්‍රීඩාව පිළිබඳව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) එලන ලද පත්තර පිටු එකක් පමණ භාවිත වේ.

(2) මෝරා එක් වරක් කන විට දූපත් ප්‍රමාණය දෙගුණ වේ.

(3) මෝරෙක් පැමිණ එක් මිනිසෙකු සපා කෑ විට එම පුද්ගලයා ද මෝරෙක් බවට පත්වෙයි.

(4) කෑ නොගසා දූපතට ගොඩ විය යුතු අතර කෑ ගැසූ විට මෝරා පැමිණි සපා කයි.

29. රංග ක්‍රීඩා කිරීමෙන් සිදුවන ප්‍රයෝජනයක් නොවන්නේ,

(1) සාමූහිකව කටයුතු කිරීමේ හැකියාව ලැබීම.

(2) ක්ෂණික තීරණ ගැනීමට හැකියාව ලැබීම.

(3) ජයග්‍රහණය පමණක් ඉලක්කගත වීම.

(4) අවධානය හා අවධානම පිළිබඳ දියුණුවක් ලැබීම.


SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

30. ශිථිලකරණ අභ්‍යාසයක් සඳහා නිදසුනක් නොවන්නේ,
   (1) හිම කන්දක් සේ දිය වීම.
   (2) දෑස් පියාගෙන තමා අවට ශබ්ද හඳුනා ගැනීම.
   (3) ඉටි පන්දමක් සේ දියවීම.
   (4) තමා නෙළුම් ඇටයක් යැයි සිතා පැළවී, මල් පිපී මලක් බවට පත්ව එය පරවී යෑම නිරූපණය

- ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති ඡායාරූප ඇසුරෙන් පිළිතුරු සපයන්න.


A


B


C


D


E

31. හාස්‍ය රංගනය සඳහා වඩාත් ප්‍රකට වූ නළුවා / නිළිය වන්නේ,
   (1) A (2) B (3) C (4) D

32. '' විකෘති '' නාට්‍යයේ ප්‍රධාන චරිතයකට දායක වූයේ,
   (1) B (2) C (3) D (4) E

33. '' සුබ සහ යස'' නාට්‍යය නිර්මාණය කර එහි ප්‍රධාන චරිතයකට පණ පොවන ලද්දේ,
   (1) A (2) B (3) C (4) D

34. නාට්‍ය ධර්ම ශෛලිය මගින් දෛනික ජීවන ප්‍රශ්න කතිකා කිරීම සඳහා '' ජනේලය '' නම් වේදිකා නාට්‍ය නිර්මාණය කරන ලද්දේ,
   (1) A (2) B (3) C (4) D

35. ''තාරාවෝ ඉගිලෙති '' නාට්‍යයේ රංගනය සඳහා මෙන්ම ගායනය සඳහා ද දායක වූයේ,
   (1) B (2) C (3) D (4) E

36. අංගරචනය සිදු කිරීමේ දී මුහුණ ප්‍රධාන කොටස් කීපයකට බෙදනු ලබයි ද?
   (1) 4 (2) 5 (3) 6 (4) 7

37. සංගීතය කිසිදු අයුරකින් භාවිතා නොකරන වේදිකා නාට්‍යයක් වන්නේ,

   (1) කැළණි පාලම (2) තලමල පිපිලා
   (3) මනමේ (4) සිංහබාහු

38. නාට්‍ය ගීතයක් ගායනය කිරීමේ දී සැළකිලිමත් විය යුතු කරුණක් නොවන්නේ,

   (1) පද නිවැරදිව උච්චාරණය (2) හඬ පාලනය
   (3) චරිතයට උචිත භාව ප්‍රකාශනය (4) ගීතය ඉතා මිහිරි ලෙස ගායනය


SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

39. '' දික්තල කාලගෝල '' නාට්‍යයේ එන නාට්‍ය ගීතයක් නොවන්නේ,

(1) අන්න බලන් සඳ............ (2) හිටපල්ලා හිටපල්ලා නොගිහින්..........
(3) අම්බරයේ සඳ සේ දිලී ......... (4) සත් අවුරුද්දක් මෙහෙකර.............

40. වේදිකා නාට්‍ය සඳහා භාවිත වන අභිනය සංඛ්‍යාව වන්නේ,

(1) 3 (2) 4 (3) 5 (4) 6

**


SLGURU.LK
For Educational Purpose Only

“Reading is a basic tool in the living of a good life.” — Joseph Addison

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

**ii කොටස**

පළමු ප්‍රශ්නය සමග තව ප්‍රශ්න හතරකට පිළිතුරු ලියන්න.

01. පහත දී ඇති සංවාද ඛණ්ඩය ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

" පොත පතේ මිස කුස පබාවතිලා අප අතර කොයින්ද? ඇරත් මේ ගගෙන් එගොඩ වෙන්න බැරි තමුසෙ ළග ඇති වීයාම මොකද්ද ? "

i. ඉහත දෙබස් ඛණ්ඩය අන්තර්ගත වේදිකා නාට්‍යයේ ශෛලිය හා සම්ප්‍රදාය වෙන වෙනම් නම් කරන්න.

ii. මෙම අවස්ථාවේ නළු නිළියන් කී දෙනෙක් රංගනයේ යෙදේ ද? (ලකුණු 02 යි)

iii. මෙහි සඳහන් ප්‍රකාශය සිදු කරනු ලැබූ චරිතය නම් කරන්න. (ලකුණු 02 යි)

iv. ඉහත ප්‍රකාශය සිදු කළ චරිතය " තමුසේ ' යනුවෙන් ආමන්ත්‍රණය කරන ලද්දේ කා හට ද? (ලකුණු 02 යි)

v. මෙලෙසින් ප්‍රකාශයක් කිරීමට ප්‍රකාශය සිදු කළ තැනැත්තාට හේතු වූ කාරණය කුමක්ද? (ලකුණු 02 යි)

iv. කාලගෝල යන නමෙහි අර්ථය ලියන්න (ලකුණු 02 යි)

02. i. පහතරට සම්ප්‍රදායට ආවේණික ශාන්තිකර්ම 02 ක් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. ඔබ ඉහත නම් කළ ශාන්ති කර්ම වල දක්නට ලැබෙන නාට්‍යමය පෙළපාලි 04 ක් නම් කරන්න.

(ලකුණු 04 යි)

iii. ඉන් එක් නාට්‍යමය පෙළපාලියක ඇති නාට්‍යමය ලක්ෂණ 03 ක් උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 06 යි)

03. 1. අංග රචනය හඳුන්වන්න. (ලකුණු 02 යි)

ii. අංග රචනය සඳහා භාවිතා කරන අමුද්‍රව්‍ය 02 ක් හා උපකරණ 02 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

iii. ඔබට වේදිකා නාට්‍යක අංග රචනය කිරීමට අවස්ථාවක් ලැබුණු විට එම කාර්ය සැළකිලිමත් විය යුතු කරුණු 03 ක් විස්තර කරන්න. සිදු කිරීම සඳහා (ලකුණු 06 යි)

04. i. රංග අභ්‍යාසයක් යනු කුමක්ද? (ලකුණු 02 යි)

ii. රංග අභ්‍යාස 04 ක් නම් කර එම එක් එක් රංග අභ්‍යාසයන් මගින් නළුවකුට ලැබෙන ප්‍රයෝජන එක බැගින් සඳහන් කරන්න. (ලකුණු 04 යි)

iii. ඔබ දන්නා රංග අභ්‍යාසයක්/ රංග ක්‍රීඩාවක් පියවරින් පියවර සිදු කරන ආකාරය විස්තර කරන්න.

(ලකුණු 06 යි)

05.i. සමාරෝපය හඳුන්වන්න. (ලකුණු 02 යි)

ii. සමාරෝපයෙහි කොටස් කීයද? ඒවා නම් කරන්න. (ලකුණු 04 යි)

iii. ඔබ ඉහත සඳහන් කළ සමාරෝපයෙහි කොටස් විස්තර කර නළුවාට වඩා වැදගත් වන්නේ කුමන සමාරෝපයදැයි පහදන්න. (ලකුණු 06 යි)


SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

06. i. ඔබගේ විෂය නිර්දේශයට අන්තර්ගත නාට්‍යකරුවන් 02ක් නම් කරන්න. (ලකුණු 02 යි)

ii. එම නාට්‍යකරුවන් දෙදෙනා විසින් නිර්මාණය කරන ලද වේදිකා නාට්‍ය 04 ක් නම් කරන්න. (ලකුණු 04 යි)

iii. ඔබ විසින් ඉහත නම් කළ එක් නාට්‍යකරුවෙකු සිංහල නාට්‍ය ඉතිහාසයට සිදු කළ සේවාව සැකෙවින් දක්වන්න. (ලකුණු 06 යි)

07. පහත දැක්වෙන කතා සාරාංශය පදනම් කර ගනිමින් නාට්‍යෝචිත අවස්ථාවක් ගොඩ නැගෙන පරිදි නාට්‍ය පෙළක් රචනා කරන්න.

කසුන් 10 වසරේ ඉගෙනුම් ලබන ඉතා ප්‍රියමනාප ගුරුවරුන්ගේ ආදරයට ලක් වූ ශිෂ්‍යයෙකි. ඔහු ඉගෙනීමට මෙන්ම ක්‍රීඩාවට ද එක සේ දක්ෂ වන අතර ඔහුගේ මව පාසලට දැනුම් දී ඇති පරිදි ඔහුගේ පියා ඔහු කුඩා වියේ දී මිය ගොස් ඇත. දිනක් පාසලට පැමිණි පුද්ගලයෙකු කසුන්ගේ විදුහල්පතිතුමා මුණ ගැසී තමා කසුන්ගේ පියා බවත් කසුන් මුණ ගැසී කතා කිරීමට අවශ්‍ය බවක් ප්‍රකාශ කරයි..... ඔබට අවශ්‍ය පරිදි චරිත යොදා ගත හැකි අතර පහත ශීර්ෂ යටතේ ලකුණු ප්‍රදානය කරනු ලැබේ.

i. පසුබිම, කාලය, සිදුවීම හා වත මැවීමට අවශ්‍ය පරිදි රංග විධාන සමග සංවාද රචනා කිරීම. (ලකුණු 02 යි)

ii. චරිත අතර ගැටුමක් ඇතිවන අයුරින් අවස්ථාව ගොඩ නැගීම. (ලකුණු 04 යි)

iii. නොසිතූ පෙරළියක් සහිත නාසෝචිත අවස්ථාවක් නිර්මාණය කිරීම. (ලකුණු 06 යි)

* * *


SLGURU.LK
For Educational Purpose Only